චක්‍රලේඛ අංක - PRE/2024/46

**TR - 08**

මගේ අංකය :- TR/PRE/CIR/2024
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2024.08.26

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**ජනාධිපතිවරණය - 2024.09.21**
**ඡන්ද පොළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් රැගෙන එන පෞද්ගලික වාහන ඡන්ද පොළ රාජකාරී සඳහා යොදා ගැනීම.**

ඡන්ද පොළ රාජකාරී සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වශයෙන් පත්කරනු ලබන ඔබගේ දිස්ත්‍රික්කයේ සේවය කරන නිලධාරීන්ට පෞද්ගලික වාහන ඇත්තේ නම් ඒවා දිස්ත්‍රික්කය ඇතුළත පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ඡන්ද පොළ රාජකාරී සඳහා රැගෙන යාමට අනුමැතිය දිය හැකිය. එසේ ගෙන යනු ලබන පෙට්‍රල් වාහන සඳහා කිලෝමීටර් එකකට රුපියල් 52.00 ක් සහ ඩීසල් වාහන සඳහා කිලෝමීටර් එකකට රුපියල් 47.00 ක් බැගින් ගෙවීම් කළ හැකිය. **තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයෙන් පිට දිස්ත්‍රික්කයක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ලෙස රාජකාරී සඳහා පත්කර ඇති නිලධාරීන් වෙතොත් ඔවුන් තම පෞද්ගලික වාහනය ඡන්ද විමසීමේ රාජකාරී සඳහා රැගෙන නොයා යුතුය.**

02). **කොන්දේසි :**

I. එම වාහනය කැරළි කෝලහල හා මහජන කැළඹීම් ආවරණය සහිත පූර්ණ රක්ෂණය කළ වාහනයක් වීම හා වාහනය ඉතා හොඳ ධාවන තත්වයෙන් තිබීම.

II. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වාහනය නොපැදවිය යුතු අතර, ඒ සඳහා පෞද්ගලිකව රියදුරෙක් යොදවා ගත යුතුය. මැතිවරණ කාර්යය මණ්ඩලයට ගෙවීම් පිළිබඳව වූ චක්‍රලේඛයෙහි පෞද්ගලික රියදුරෙකුට කරන ගෙවීම් පිළිබඳව සඳහන් කර ඇත. (ගෙවීම කෙරෙනුයේ රියදුරු නමට චෙක්පතක් මඟිනි.)

III. එම වාහනය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති සහායක, පොලිස් නිලධාරයකු හා රියදුරු ඇතුළු අවම හතර දෙනෙකුට පහසුවෙන් ගමන් කළ හැකිවිය යුතු අතර, එම අයගේ ගමන් මලු, ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් ආරක්ෂක ද්‍රව්‍ය රැගෙන යාමටද ඉඩ පහසුකම් තිබිය යුතුය. මේ සඳහා මරුටි, මාර්ච්, ස්ටාර්ලට් වැනි කුඩා ප්‍රමාණයේ කාර් (Beetle Cars) භාවිතා නොකළ යුතුය.

IV. පෞද්ගලික වාහන යොදා ගැනීමට බලාපොරොත්තු වන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඒ සඳහා තම දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී / නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව ඔවුනට කරුණාකර දැනුම් දෙන්න.

V. ඉහත පරිදි කිලෝමීටර් ගාස්තු ගෙවිය හැකි වන්නේ අදාළ වාහනය සිය කාර්ය මණ්ඩලය හා ඡන්ද පෙට්ටි රැගෙන ඡන්ද පොළට යාමට සහ ඡන්ද විමසීමෙන් පසු එම ඡන්ද පෙට්ටි රැගෙන ඒමට යොදා ගනු ලැබී නම් පමණි.

VI. ඡන්ද පොළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් රැගෙන එන පෞද්ගලික වාහන සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා වූ (V-3)ආදර්ශ ආකෘතියක් මේ සමග අමුණා ඇත. එය පිටපත් තුනකින් සම්පූර්ණ කර ලබා ගත යුතු අතර රාජකාරී නිමවීමෙන් පසු එහි B කොටස සම්පූර්ණ කර පිටපත් දෙකක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට භාර දීමට කටයුතු කරන්න. මෙහි එක් පිටපතක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වාහනයට අදාළ ගෙවීම් වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු අතර අනෙක ඔහුගේ රියදුරුගේ ගෙවීම් වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

VII. ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය රැගෙන, නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ සිට තමාට නියමිත ඡන්ද මධ්‍යස්ථානය වෙත යාමට ගමන් කළ දුර ප්‍රමාණය ද ඡන්ද විමසීම නිමවීමෙන් පසු ඡන්ද පෙට්ටිය භාරදීම සඳහා ආපසු පැමිණීමට අදාළ වන දුර ප්‍රමාණයද, තම පදිංචි නිවස සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුල පිහිටා ඇත්තේ නම් ඔහු ගමන පිටත්වූ ස්ථානය නිවස සේ සළකා නිවසේ සිට අදාළ නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත පැමිණීමට හා රාජකාරී නිමවීමෙන් පසු ආපසු තම නිවස දක්වා ගමන් කිරීමට ඇති දුර ප්‍රමාණය ද සැළකිල්ලට ගෙන මුළු දුර ප්‍රමාණය සඳහා එක් ගමන් වාරයකට පමණක් කිලෝමීටර් ගාස්තු ගෙවිය හැකිය.

VIII. **මෙම ගෙවීම් හා රියදුරුගේ දීමනා ද මැතිවරණ කාර්යාලවලින් පමණක් සිදු කළ යුතු අතර, වෙනත් කාර්යාල මගින් ගෙවීම් කර ප්‍රතිපූර්ණ කරවා ගැනීමට ඉදිරිපත් නොකරන ලෙසට උපදෙස් දිය යුතුය. එවැනි ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ඒවා ප්‍රතික්ෂේප කරන බවද කාරුණිකව දැනුම් දෙන්න.**

මෙම වාහන සඳහා නිලධාරියාගේ සේවා ස්ථානයෙන් හෝ මැතිවරණ රාජකාරී පැවරී ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් / නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලයකින් හෝ කිසිදු අයුරකින් ඉන්ධන ලබා නොදිය යුතුය.

03). ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් රැගෙන එනු ලබන වාහන සඳහා ගෙවීම් කිරීමේදි **කුලී පදනම මත ලබා ගන්නා වාහන සඳහා ගෙවීම් කරනු ලබන ගාස්තුමත ගෙවීම් සිදු නොකිරීමට** අදාල බලධාරීන් වගබලා ගත යුතු බවද කාරුණිකව දන්වමි.

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත් :
1. විගණකාධිපති
2. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව.
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
4. ප්‍රධාන මූලා නිලධාරි
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක

} කාරුණික දැන ගැනීම සඳහා

( පිටපත් තුනකින් සම්පූර්ණ කරන්න)

V-3

**ජනාධිපතිවරණය - 2024.09.21**

**ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් රැගෙන එන පෞද්ගලික වාහන පිළිබඳ තොරතුරු**

1. නිලධාරියාගේ නම : ..........................................................................................................
2. කාර්යාලයීය ලිපිනය : .......................................................................................................
3. පෞද්ගලික ලිපිනය : ........................................................................................................
4. ජංගම දුරකතන අංකය : ....................................................................................................
5. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වශයෙන් පත්කර ඇති දිස්ත්‍රික්කය : .........................................
   ***(මෙය ඔබගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය විය යුතුය.)***
6. ඔබගේ පෞද්ගලික වාහනය පිළිබඳ තොරතුරු
   ***(ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)***
   වාහනයේ අංකය :........................... (පෙට්‍රල්/ඩීසල්) *
   වර්ගය : ........................................ ආසන ගණන : .........................................
   වාහනය පදවන රියදුරුගේ නම : .........................................................................................
   ලිපිනය : ..........................................................................................................................
   රියදුරු බලපත් අංකය : .......................................................................................................
7. නිවසේ සිට නිකුත් කිරීමේ මධ්‍යස්ථානයට ඇති දුර ප්‍රමාණය (කි.මී) : ...................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ අංක PRE/2024/46 හා 2024.08.26 දිනැති චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි හා කිලෝමීටරයකට *පෙට්‍රල් වාහන සඳහා <u>රුපියල් 52/-</u> ක්/ *ඩීසල් වාහන සඳහා <u>රුපියල් 47/-</u> ක් බැගින් වූ ප්‍රමාණයන් යටතේ ගාස්තු ලබා ගැනීමට එකඟ වෙමි.

දිනය :.2024...................................... ..............................................

නිලධාරිගේ අත්සන

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වශයෙන් තෝරාගෙන ඇති ඉහත සඳහන් නිලධාරියාට අයත් අංක ............ දරණ වාහනය ඔහුට නියමිත ඡන්ද පොළ රාජකාරි සඳහා යොදා ගැනීමට අනුමැතිය දෙන ලදී.

දිනය : 2024. ........................................................

සහකාර තේරීම් භාර නිලධාරි (ප්‍රවාහන)
(නම සහිත නිල මුද්‍රාව තබන්න.)

---

**B කොටස - (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)**

1. නිවසේ සිට නිකුත් කිරීමේ මධ්‍යස්ථානයට ඇති දුර ප්‍රමාණය (කි.මී)X 2 - ............................

   A. නිකුත් කිරීමේ මධ්‍යස්ථානයෙන් පිටත්වන විට මයිලෝ මීටරයේ කියවීම - ............................

   B. භාර ගැනීමේ මධ්‍යස්ථානය වෙත ආපසු පැමිණි පසු මයිලෝ මීටරයේ කියවීම - ..........................

2. ගමන් කල දුර : ( B –A ) = ..........................

PRE/2024/46 හා 2024.08. 26 දිනැති චක්‍රලේඛයෙන් දී ඇති උපදෙස් පරිදි ඔහු ඡන්ද විමසීම් රාජකාරි සඳහා ගමන් කර ඇති මුළු දුර ප්‍රමාණය කි.මී. : ( 1+2 ) - ............................

දිනය : 2024................. ................ ..................................

සහකාර තේරීම් භාර නිලධාරි (ප්‍රවාහන)
(නම සහිත නිල මුද්‍රාව තබන්න.)

**සැළකිය යුතුය** : ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙතින් <u>මෙම ආකෘතිය පිටපත් තුනකින්</u> සම්පූර්ණ කර ලබාගෙන රාජකාරි නිමවී ආපසු යාමට පෙර B කොටස පුරවා පිටපත් දෙකක් ඔහුට /ඇයට ආපසු භාර දෙන්න. එක් පිටපතක් කිලෝමීටර් ගාස්තු ඉල්ලුම් කිරීමේදී වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු බවට ද අනෙක් පිටපත තම රියදුරුගේ දීමනා ඉල්ලුම් කරන වවුචරයට අමුණා ඉදිරිපත් කළයුතු බවටද ඔහුට /ඇයට කරුණාකර දන්වන්න.

(* අනවශ්‍ය වචන කපා හරින්න.)